CovidSurg | 2020
එක්සත් රාජධානියේ අනුවාදය

# කොවිඩ්-19 වසංගතය අතරතුර සැත්කමක් කිරීම

GlobalSurg | NIHR Global Health Research Unit on Global Surgery

# මෙම මාර්ගෝපදේශය ගැන

ඔබ හෝ ඔබගෙ ආදරණීයයෙකු සැත්කමක් සඳහා සැලසුම් කිරීමට හෝ බලාපොරොතුවෙන් සිටිනවා විය හැකිය. මෙය ඔබට අසහනකරී කාලයක් බව අපට වැටහී ඇති අතර ඔබට ගැටලු රාශියක් ඇත.

කොවිඩ්-19 (COVID-19) වසංගත කාලය තුළ සැත්කමක් කිරීමේ අවදානම රෝගීන්ට සහ ඔවුන්ගේ පවුල්වල සමීප සාමාජිකයන්ට අවබෝධ කර ගැනීම සඳහා මෙම පොත් පිංච නිර්මාණය කර ඇත. මෙම වසංගත කාලයේදී අපි ඔබ ගැන සැලකිලිමත් වන්නේ කෙසේද සහ ඔබව ආරක්ෂාකාරීව තබා ගැනීම සඳහා අපි එකට වැඩ කරන්නේ කෙසේද යන්න අපි විස්තර කරමු.

*මෙම පොත් පිංච නිර්මාණය කිරීමට උදව් කළ අපගේ රෝගී උපදේශක කණ්ඩායමට අපි බෙහෙවින් ස්තුතිවන්ත වෙන්නේමු.*



*වැඩි විස්තර සඳහා කරුණාකර පිවිසෙන්න :*
*http://nihrglobalsurgery.org/surgeryduringcovid*

# අන්තර්ගතය


ශල්‍ය රෝගීන් ආරක්ෂා කිරීම සඳහා කරන්නේ කුමක්ද? 4

4
ශල්‍යකර්මය අතරතුර සහ ශල්‍යකර්මයෙන් පසුව කොවිඩ්-19 (COVID-19) ඇතිවීමෙ අවදානම කුමක්ද?

5
සැත්කම් සඳහා සැලසුම් කිරීම

6
ශල්‍යකර්මයේදී හා පසුව මාව ආරක්ෂා කර ගැනීමට කාර්ය මණ්ඩලය කරන්නේ කුමක්ද?

7
මගේ සැත්කම අතරතුර සහ සැත්කමෙන් පසුව ආරක්ෂිතව සිටීමට මට කල හැක්කේ කුමක්ද ?

8
මට හදිසි ශල්‍යකර්මයක් අවශ්‍ය නම් කුමක් කළ යුතුද? 8

මට කොවිඩ්-19 (COVID-19) වැළඳී තිබේ නම් සහ සැත්කමක් අවශ්‍යයි නම් කුමක් කළ යුතුද? 9

ශල්‍යකර්මය අවලංගු කිරීම් සහ ප්‍රමාද වීම 10

ප්‍රධාන යෙදුම් 11

සටහන්

## ශල්‍ය රෝගීන් ආරක්ෂා කිරීම සඳහා කරන්නේ කුමක්ද?

මෙම වසංගත කාලයේදී සැත්කම් අවශ්‍ය රෝගීන් එම සැත්කම් කිරීමට පෙර සහ පසුව කොවිඩ්-19 (COVID-19) රෝගයෙන් ආරක්ෂා කිරීමට ලොව පුරා සෞඛය සේවා දැඩි උත්සාහයක් දරයි.

මෙම වසංගත කාලයේදී සැත්කමක් අවශ්‍ය රෝගීන් ප්‍රශස්ථව කළමනාකරණය කිරීම සහ ශල්‍යකර්මයට පෙර හෝ පසුව වෛරසය වැළඳීම පිළිබඳ වඩාත් යාවත්කාලීන තොරතුරු විද්‍යාත්මක දත්ත මත පදනම්ව ශල්‍ය වෛද්‍යවරුන් සහ පර්යේෂකයන් විසින් රැස්කරගෙන ඇත.

**මෙම වසංගත කාලයේදී සැත්කම් සඳහා ලක්කරන අතිමහත් බහුතර රෝගීන්, ඔවුන්ගේ ශල්‍යකර්මයට පෙර හෝ පසුව කොවිඩ්-19 (COVID-19) වැළඳීමට ලක්නොවනු ඇත**

## මගේ ශල්‍යකර්මයට පසුව කොවිඩ්-19 (COVID-19) වැළඳීමෙ ඇති අවදානම් මොනවාද?



පර්යේෂණ වලින් හෙළි වී ඇත්තේ ශල්‍යකර්මයකින් පසු වෛරසය වැළඳුණු රෝගීන් හට හුස්ම ගැනීමේ සංකූලතා වඩාත් දරුණු විය හැකි බවයි. මෙම රෝගීන් අතර මරණ අනුපාතයද ඉහළ ගොස් ඇති බවට සොයා ගෙන ඇත.


දිගු කාලීන බෝ නොවන රෝග ඇති රෝගීන් ද කොවිඩ්-19 (COVID-19) වැළඳීමට වැඩි අවදානමක් ඇත. ශල්‍ය රෝගීන් ආරක්ෂා කිරීම සඳහා අපි එකට වැඩ කිරීම මෙතරම් වැදගත් වන්නේ එබැවිනි.

## මම ආරක්ෂිතව සිටින්නේ කෙසේද?

කොවිඩ්-19 (COVID-19) වසංගතය තුළ ඔබ හෝ ඔබේ පවුලේ සාමාජිකයෙකු සැත්කම් කිරීමට සූදානම් වන්නේ නම්, රෝහලේ ශල්‍ය වෛද්‍යවරයා සහ ඔහුගේ කණ්ඩායම මේ ගැන ඔබ සමඟ සාකච්ඡා කරනු ඇත. ඔබේ රැකවරණය හැකි තරම් ආරක්ෂිත කිරීමට ඔවුන් මහන්සි වනු ඇත

## මගේ ශල්‍යකර්මය සිදු වන්නේ කවදාද?

ආරක්ෂිතව හැකි ඉක්මනින් ඔබගේ සැත්කම කිරීමට ප්‍රමුඛතාවය දෙනු ඇත. මෙය රෝහල් ඇඳ ඇතිරිලි සහ කොවිඩ්-19 (COVID-19) හි දේශීය මට්ටම් ඇතුළු සම්පත් පිළිබිඹු කරයි. දිගු පොරොත්තු ලේඛනය අඩු කිරීම සඳහා හදිසි ප්‍රතිකාර නැවත ආරම්භ කරන බැවින් ඔබට සවස් වරුවේ හෝ සති අන්තයේ සැත්කම සිදුකළ හැකිය.




## මගේ ශල්‍යකර්මය සිදුවන්නේ කොහේද?


රෝගීන්ගේ ආරක්ෂාව සහතික කර ඇති පරිසර ඔබේ සැත්කම සිදු කරනු ලැබේ. NHS හෝ නොමිලේ පහසුකම් සැලසෙන පෞද්ගලික රෝහලක ඔබේ සැත්කම සිදු කරනු ඇතැයි එයින් අදහස් විය හැක.

## මගේ ශල්‍යකර්මය සඳහා මා සූදානම් වන්නේ කෙසේද?

රෝහලේ ශල්‍ය වෛද්‍යවරයා සහ ඔබගේ කණ්ඩායම ඔබට මග පෙන්වනු ඇත. ඔබට:

- ඔබේ ශල්‍යකර්මයට පෙර යම් කාලයක් සඳහා ස්වයං හුදකලා වීම
- ඔබේ ශල්‍යකර්මයට පෙර සාර්ස්-කෝව්-2 (SARS-CoV-2) ආසාදනය සඳහා පරීක්ෂාවට ලක් කිරීමට පවසනු ඇත.

සංකූලතා අවම කිරීම සඳහා, වෛරසය සඳහා ධනාත්මක බවට තහවුරු කරන රෝගීන්ට සාමාන්‍යයෙන් ඔවුන්ගේ ශල්‍යකර්මය ප්‍රමාද කිරීමට පවසනු ඇත. කරුණාකර ඔබේ ශල්‍ය වෛද්‍යවරයා සමඟ ඔබේ සැත්කම සම්බන්ධ විශේෂිත අවදානම් සහ සූදානම් වීමට ගත හැකි වෙනත් විකල්ප ක්‍රම ගැන කතා කරන්න.



# ශල්‍යකර්මයේදී හා පසුව ආරක්ෂිතව සිටීම

## ශල්‍යකර්මයේදී හා පසුව මා ආරක්ෂා කර ගැනීමට කාර්ය මණ්ඩලය කරන්නේ කුමක්ද?

- ඔබගේ සහ ඔවුන්ගේ ආරක්ෂාව සඳහා රෝහල් කණ්ඩායම් පීපීඊ (PPE) (පුද්ගලික ආරක්ෂක උපකරණ) භාවිතා කරනු ඇත.
- සැත්කම් කාලය අවම කිරීම සඳහා හෝ ආසාදිත ජල බිඳිති වලට කාර්ය මණ්ඩලය නිරාවරණය වීම අඩු කිරීම සඳහා සමහර සැත්කම් වෙනස් කිරීම හෝ අනුගත විය හැකිය.
- කොවිඩ්-19 (COVID-19) හේතුවෙන් සම්මත සත්කාර සඳහා වන ඕනෑම වෙනස් කිරීමක් ඔබ සමඟ සාකච්ඡා කරනු ඇත.
- කොවිඩ්-19 (COVID-19) වලට නිරාවරණය වීම වළක්වා ගැනීම සඳහා පරිසරය තුළ කාර්ය මණ්ඩලය ඔබ ගැන සැලකිලිමත් වනු ඇත.
- රෝහල ඔබගේ අමුත්තන්ට සීමා කළ හැකිය.



පීපීඊ (PPE) වලින් සමන්විතය

නිරාවරණ කාලය අඩු කිරීම සඳහා අනුවර්තනය කරන ලද ක්‍රියාපටිපාටි


වෙනස් කරන ලද සත්කාර ඔබ සමඟ සාකච්ඡා කර ඇත

ඔබගේ සැත්කමෙන් පසු ඔබට කොවිඩ්-19 (COVID-19) වැළඳී ඇත්නම්, රෝහල් කණ්ඩායම විසින් මැතදී සිදු කරන ලද සැත්කම හේතුවෙන් ඇති වැඩි අවදානම සලකා බලනු ඇති අතර, සැත්කමෙන් හා ආසාදන වලින් සුවය ලැබීම සඳහා ප්‍රර්වර්ධන සත්කාර සපයනු ඇත.

**මතක තබා ගන්න: මෙම වසංගත කාලයේදී සැත්කම් සඳහා ලක්කරන අතිමහත් බහුතර රෝගීන්, ඔවුන්ගේ ශල්‍යකර්මයට පෙර හෝ පසුව කොවිඩ්-19 (COVID-19) වැළඳීමට ලක්නොවනු ඇත**

# ශල්‍යකර්මය සඳහා සැලසුම් කිරීම

## මගේ සැත්කම අතරතුර සහ පසුව ආරක්ෂිතව සිටීමට මට උදව් කරන්නේ කෙසේද?



- දැඩි සනීපාරක්ෂක පියවර අනුගමනය කරන්න.
- ඔබ සමාජ දුරස්ථභාවය අනුගමනය කළ යුතුද හෝ සමාජයෙන් සම්පූර්ණයෙන්ම වෙන්කළ යුතුද යන්න ඔබේ වෛද්‍ය කණ්ඩායම උපදෙස් දෙනු ඇත.
- ඔබට මුහුණු ආවරණයක් ඇඳීමට උපදෙස් දෙනු ඇත.
- ඔබව 'කොවිඩ්-19 (COVID-19) වලින් තොර පරිසරයක රැකබලා ගනු ඇත.
- අමුත්තන් රෝහලේදී සහ ඔබ ගෙදර ගිය පසු සීමා කිරීමට උපදෙස් දෙනු ඇත.
- පසු විපරම් දුරකථන සායන වලට සීමා කරනු ඇත.

ඔබේ ශල්‍ය වෛද්‍යවරයා සහ ඔහුගේ කණ්ඩායම ඔබ රෝහලෙන් පිටවීම අනුමත කරනු ඇත්තේ එය ආරක්ෂිත වූ විට පමණි. ඔබේ ශල්‍යකර්ම හා අදාළ තුවාල, තුවාල සඳහා ප්‍රරතිකාර කරන්නේ කෙසේද, වේදනාව බෙහෙත්, ආහාර සහ ව්‍යායාම වැනි කරුණු පිළිබඳව ඔවුන් ඔබට උපදෙස් දෙනු ඇත.

ඔබගේ ප්‍රකෘතිය පිළිබඳව ඔබට ප්‍රශ්න ඇත්නම්, කරුණාකර ඔබේ වෛද්‍ය කණ්ඩායමෙන් විමසන්න.


නිවසේදී සහ රෝහලේදී සුවය ලැබීම ඔබට තනිකමක් ඇතිවිය හැකිය. ඔබ ඔබ ස්වයං හුදෙකලා වීමට යන්නේ නම් ඔබට උදව් කළ හැකි පවුලේ අය, මිතුරන් හෝ අසල්වාසීන් දැනුවත් කිරීම හොඳ අදහසකි.

# හදිසි සැත්කම්

## මට හදිසි ශල්‍යකර්මයක් අවශය නම් කුමක් කළ යුතුද?

සමහර රෝගීන්ට රෝහලට ඉදිරිපත් කිරීමෙන් පැය හෝ දින කිහිපයක් ඇතුළත සැත්කමක් අවශ්‍ය වේ. වසංගතය රෝගීන් වෛද්‍ය සේවා පැතීම නතර නොකළ යුතුය. **ඔබ අසනීප නම් ඔබ ප්‍රරමාද නොවිය යුතුය. ඔබ රැකබලා ගැනීමට ශල්‍ය කණ්ඩායම් සූදානම්.**

සමහර රෝගීන් රෝහලට පැමිණීමට පෙර කොවිඩ්-19 (COVID-19) සහිත පුද්ගලයෙකු සමඟ සමීප සබඳතාවක් පවත්වා තිබිය හැක. මෙම නිරාවරණය නිසා කොවිඩ්-19 (COVID-19) රෝග ලක්ෂණ මතුවිම ශල්‍යකර්මය වන කාලය තුළ ඇති විය හැක.






ශල්‍යකර්මය හා කොවිඩ්-19 (COVID-19) යන දෙකටම මුහුණ දීමට ශරීරය උත්සාහ කරන බැවින්, ශල්‍යකර්මයකට භාජනය වන කොවිඩ්-19 (COVID-19) ආසාදිත රෝගීන් විශේෂයෙන් අවදානමට ලක්වන බව මෙතෙක් පර්යේෂණ වලින් පෙන්නුම් කර ඇත.

## මට කොවිඩ්-19 (COVID-19) වැළඳී සහ ශල්‍යකර්මයක් අවශ්‍ය නම් කුමක් කළ යුතුද?

ශල්‍යකර්මයේදී වෛරසය ආසාදනය වූ රෝගීන්ට දැඩි කොවිඩ්-19 (COVID-19) රෝග ලක්ෂණ ඇතිවීමේ වැඩි අවදානමක් ඇත.

හුස්ම ගැනීමේ අපහසුතා අවදානම ~ 50%
මරණ අවදානම ~ 25%



මෙම රෝගීන් තුළ හුස්ම ගැනීමේ අපහසුතා ආසන්න වශයෙන් 50% ක් සහ මරණ අවදානම 4 න් 1 ක් ඇත. මෙම අවදානම හේතුවෙන්, ශල්‍යක රෝගීන් ආරක්ෂා කිරීමට සහ වෛරසය වැළඳුණු රෝගීන්ට උපකාර කිරීමට අමතර සැලකිල්ලක් දක්වයි.

# සැත්කම අවලංගු කිරීම් සහ ප්‍රමාද වීම

## මගේ ශල්‍යකර්මය අවලංගු කළේ ඇයි?

**බොහෝ හේතු නිසා ඔබේ ශල්‍යකර්මය අවලංගු කිරීමට ඇත:**

- කොවිඩ්-19 (COVID-19) රෝහලෙන් ආසාදනය වීමේ අවදානම අවම කිරීමට සහ රෝගීන්ට ඇති විය හැකි සංකූලතා අවම කිරීමට.
- කොවිඩ්-19 (COVID-19) ආසාදිත රෝගීන්ගේ හදිසි ප්‍රතිකාර සඳහා සහාය වීම සඳහා රෝහල් කාර්ය මණ්ඩලය නිදහස් කිරීමට
- කොවිඩ්-19 (COVID-19) ආසාදිත රෝගීන්ගේ හදිසි ප්‍රතිකාර සඳහා පීපීඊ (PPE), හුස්ම ගැනීමේ යන්ත්‍ර, වාට්ටුව හෝ දැඩි සත්කාර ඇඳන් නිදහස් කිරීමට.

## පොරොත්තු ලේඛනයට බලපාන්නේ කෙසේද?



කොවිඩ්-19 (COVID-19) වසංගතය හේතුවෙන් ගෝලීය වශයෙන් මෙහෙයුම් මිලියන 28 ක් කල් දමා ඇත.



වසංගතය හේතුවෙන් රෝගීන් මිලියන භාගයකට වඩා වැඩි ප්‍රමාණයකගේ සැත්කම කල් දමනු ඇතැයි එක්සත් රාජධානියේ අපි අපේක්ෂා කරමු.

මෙම ඇස්තමේන්තු පදනම් වී ඇත්තේ කොවිඩ්-19 (COVID-19) හි පළමු සති 12 තුළ අවලංගු කිරීම් පිළිබඳ ගෝලීය අධ්‍යයනයක් මත ය.

## ශල්‍යකර්මයක් කිරීම දැන් ආරක්ෂිත ඇයි?

වසංගත ප්‍රකෘතිමත් වීමේ කාලය තුළ සිදුකල හැකි සැත්කම් ප්‍රමාණය උපරිම කිරීම සඳහා සැලකිය යුතු ප්‍රති-සංවිධානයක් සිදුවෙමින් පවතී. ආරක්ෂිතව හැකි ඉක්මනින් ප්‍රතිකාර ලබා ගැනීමට රෝගීන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.



# ප්‍රධාන යෙදුම්

## කොවිඩ්-19 (COVID-19) සහ සාර්ස්-කෝව්-2 (SARS-CoV-2)

කොවිඩ්-19 (COVID-19) යනු මෙම වසංගත රෝගයේ නමයි. එය සාර්ස්-කෝව්-2 (SARS-CoV-2) (දරුණු ශ්වසන සින්ඩ්‍රෝම් කොරෝනා වයිරස්-2) නමින් හැඳින්වෙන වෛරසයක් මගින් ඇතිවේ. එය බොහෝ දුරට පැතිරෙන්නේ ආසාදිත පුද්ගලයෙකුගේ නාසයෙන් හෝ මුඛයෙන් පිටවන බිංදු මගිනි. කොවිඩ්-19 (COVID-19) සහිත බොහෝ රෝගීන් රෝහල් ප්‍රතිකාර අවශ්‍යය නොවන, මෘදු හෝ මධ්‍යස්ථ රෝග ලක්ෂණ පෙන්වයි. රෝගීන්ගෙන් සුළු පිරිසකට වඩා දරුණු රෝග ලක්ෂණ ඇති අතර, ඔවුන් රෝහලට ඇතුළත් කළ හැකිය, නැතහොත් ශ්වසන සහ අනෙකුත් ඉන්ද්‍රිය ආධාරක වල සහාය අවශ්‍යය වේ.

## කොවිඩ් -19 (COVID-19) ප්‍රතිකාරය

වෛරසයට විශේෂයෙන් ප්‍රරතිකාර කිරීම සඳහා දැනට කිසිදු ප්‍රරතිකාරයක් නොපවතින බැවින් ප්‍රරධාන ප්‍රරතිකාර වන්නේ උපකාරක සත්කාර රැකවරණයයි. එබැවින් වැළැක්වීම, විශේෂයෙන් වඩාත් අවදානමට ලක්විය හැකි කණ්ඩායම් සඳහා ප්‍රරධාන වේ.

## කොවිඩ් -19 (COVID-19) තොර පහසුකම්

මෙය කොවිඩ් (COVID) රහිත වාට්ටු, මෙහෙයුම් කාමර සහ දැඩි සත්කාර පහසුකම් සහිත නම් කරන ලද කොවිඩ් -19 (COVID-19) රහිත රෝහලක් හෝ රෝහල් පරිසරයකි. පර්යේෂණවලින් පෙනී යන්නේ මෙවැනි ඒකකයක ඔබේ ශල්‍යකර්මයක් කිරීමෙන් කොවිඩ් -19 සම්ප්‍රේෂණය වීමේ අවදානම අඩු විය හැකි බවයි.

## කොවිඩ් -19 (COVID-19) පූර්ව පරීක්ෂා කිරීම

මෙයින් සාමානයයෙන් අදහස් කරන්නේ මුඛ සහ නාසික ස්පුබ් පමණක් නොව ඔබේ පපුවේ ස්කෑන් කිරීමද විය හැකිය. ඔබේ සැත්කමට පෙර ඔබට මේ සඳහා රෝහලට යාමට අවශ්‍යය විය හැකිය.

## නිරෝධායනය

ඔබ කොරොනා වයිරස් ආසාදනයෙන් බරපතල ලෙස පීඩාවට පත්වීමේ වැඩි අවදානමක් තිබේ නම්, උදාහරණයක් ලෙස ඔබ සැත්කමක් බලාපොරොත්තුවෙන් සිටී නම්, ඔබ රෝහලට පැමිණීමට පෙර ස්වයං-හුදෙකලා වීමට / නිරෝධායනය වීමට ඔබෙන් ඉල්ලා සිටිය හැකිය, එයින් අදහස් වන්නේ නිවසේ රැඳී සිටීම සහ කිසිදු හේතුවක් නිසා පිටව නොයාමයි. ඔබ හෝ ඔබ ජීවත් වන ඕනෑම කෙනෙකුට කොවිඩ් -19 (COVID-19) රෝග ලක්ෂණ ඇත්නම් ඔබත් නිරෝධායනය විය යුතුය.



## සමාජ දුරස්ථභාවය

ආසාදිත පුද්ගලයින් සහ රෝග පැතිරීමේ අවදානමක් ඇති පුද්ගලයින්

මගේ ශල්‍ය වෛද්‍ය කණ්ඩායමෙන් මට අහන්න අවශ්‍යය දේවල්...

වැඩි විස්තර සඳහා කරුණාකර පිවිසෙන්න
http://nihrglobalsurgery.org/surgeryduringcovid